පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2016 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

# සමාජ විද්‍යාව I (SSG I)

## සමාජ විද්‍යාවේ න්‍යාය සහ ක්‍රමවේද

එක් කොටසකින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
කාලය : පැය තුනයි.

---

## පළමු කොටස

01. කාර්මික විප්ලවය සමාජ විද්‍යාව ඇතිවීම කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න.

02. මැක්ස් වේබර්ගෙන් සමාජ විද්‍යාවට සිදු වූ සම්මාදම ගැන රචනයක් ලියන්න.

03. චාර්ලස් හෝර්ටන් කූලී විසින් ඉදිරිපත් කරන ලද සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

04. කාර්ල් මාර්ක්ස් විසින් ඉදිරිපත් කරන ලද සමාජ ස්ථරායන න්‍යාය පිළිබඳව සාකච්ඡා කරන්න.

## දෙවන කොටස

05. සමාජ විද්‍යාත්මක පර්යේෂණවල දි අවධානය යොමු කළ යුතු අංශ පිළිබඳ සාකච්ඡා කරන්න.

06. ප්‍රමාණාත්මක පර්යේෂණ යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා සුදුසු පර්යේෂණ යෝජනාවලියක් සකස් කරන්න.

08. ගුණාත්මක පර්යේෂණවල වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

- - - - - - - - - - - - - - - - -

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2016 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

# සමාජ විද්‍යාව II (SSG II)

## ව්‍යවහාරික සමාජ විද්‍යාව

කාලය පැය තුනයි
ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

---

01. ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදනයේදී ව්‍යවහාරික සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

02. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඔබට ජනවාර්ගික සහයෝගය උදෙසා ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට ඉල්ලා සිටිය හොත් ඔබ ප්‍රමුඛතාවය දෙන්නේ කුමන අංශයන්ට ද ? සාකච්ඡා කරන්න.

03. "සමාජ විද්‍යාත්මක යෙදවුම් නොමැති කම ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධන ව්‍යාපෘති අඩු ප්‍රගතියක් පෙන්වීමට බලපාන ප්‍රධානතම සාධකය වෙයි." සාකච්ඡා කරන්න.

04. ප්‍රජා සහභාගීත්වය යනු කවරේ ද? ප්‍රජා සංවර්ධන වැඩ සටහන්වලදී ප්‍රජා සහභාගීත්වය අවශ්‍ය ද? හේතු දක්වන්න.

05. "ශ්‍රී ලාංකිකයන් බහුතරයක් සුබ සාධන පරාධීනයන්ය" විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

06. වියපත් ජනගහනය ගැටළුවක් ද ? සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාව තුළ සිදුවන ප්‍රජා සංවර්ධනයේ දී රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

    I. සමෘද්ධි ව්‍යාපෘති
    II. සක්‍යතා අධ්‍යයන
    III. ගැටළු ගස
    IV. මරණාධාර සංගමයේ සුබසාධන සංගමයේ කාර්යභාරය

------------------------------******------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2016 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

# සමාජ විද්‍යාව III SSG 3

## දකුණු ආසියාව පිලිබඳ සමාජ විද්‍යාව

කාලය පැය තුනයි (03).
ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි. (08)

---

01. 'දකුණු ආසියානු ගම අර්ධ සාමාජයකි ( Part Society )' සාකච්ඡා කරන්න.

02. කුලය ඉන්දියානු උපමහාද්වීපික සංසිද්ධියක්ය යන අදහස විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

03. හින්දු ආගම සහ බෞද්ධාගම පිලිබඳ මැක්ස් වේබර් ගේ ප්‍රවාදය පරීක්ෂා කරන්න.

04. ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දකුණු ආසියාවේ ඥාතීත්වයේ කාර්යභාරය සහ දේශපාලනය අතර සම්බන්ධතාවය සාකච්ඡා කරන්න.

05. පශ්චාත් යුධ කාලීන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජ ප්‍රතිනිර්මාණ කාර්යයේදී රාජ්‍ය නොවන සංවිධානවල වැදගත්කම විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

06. දකුනු ආසියානු රටවල නව යටත් විජිතවාදී ලක්ෂණ විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් 21 සියවසේ. ආයුර්වේද ක්‍රමයේ කාර්යභාරය පරීක්ෂා කරන්න.

08. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම තුනක් පිලිබඳව කෙටි සටහන් ලියන්න.
    (අ). ශ්‍රී ලංකාවේ බලපෑම් කණ්ඩායම්
    (ආ). දකුණු ආසියානු කාන්තාවන්ගේ සමාජ තත්වය
    (ඇ). පෙරදිගවාදය
    (ඇ). දකුණු ආසියාවේ අයි .එස්. අයි. එස්. ව්‍යාපාරය
    (ඉ). ශ්‍රී ලංකාවේ නව රජයේ සමාජ ප්‍රතිපත්තිය

---